# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1877/71 - 2014 අගෝස්තු මස 29 වැනි සිකුරාදා - 2014.08.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**බූස්ස ශ්‍රී සුදර්ශනාරාම පුරාණ මහා විහාර පූජනීය ප්‍රදේශය පූජාභූමියක් ලෙස ප්‍රකාශයට පත් කිරීම**

අංක 1681/3 හා 2010 නොවැම්බර් මස 22 වැනි සඳුදා අති විශෙෂ ගැසට් පත්‍රයේ
පළ කරන ලද නියමය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1681/3 - 2010 නොවැම්බර් මස 22 වැනි සඳුදා ප්‍රසිද්ධ කරන ලද අතිවිශෙෂ ගැසට් පත්‍රය මඟින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා විසින් කරන ලද නිවේදනය පරිදි බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍ය ආචාර්ය දිසානායක මුදියන්සේලාගේ ජයරත්න වන මා හට පැවරී ඇති පූජාභූමි සැලසුම්කරණය හා සංවර්ධනය විෂයය ප්‍රකාරව මෙහි උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන ඉඩම් ප්‍රදේශයේ චිරාත් කාලීන සුරක්ෂිත බව සඳහා එම ප්‍රදේශය පූජනීය ප්‍රදේශයක් බවටත් එය ''බූස්ස ශ්‍රී සුදර්ශනාරාම පුරාණ මහා විහාර පූජාභූමිය" යනුවෙන් හඳුන්වනු ලැබිය හැකි බවටත් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ආචාර්ය දි.මු. ජයරත්න,
බුද්ධශාසන හා ආගමික කටයුතු අමාත්‍ය.

2014 අගෝස්තු මස 20 වැනි දින,
බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශය,
අංක 135, අනගාරික ධර්මපාල මාවත,
කොළඹ 07.

*උපලේඛනය*

***බූස්ස ශ්‍රී සුදර්ශනාරාම පුරාණ මහා විහාර පූජා භූමිය සංයුක්ත වන ප්‍රදේශය***

මිනින්දෝරු ජනරාල්ගේ 2011 සැප්තැම්බර් මස 25 වැනි දින අංක ජීජ්/එච්කේකේ/11/294 දරන සැලැස්මේ ලොට් ''ඒ" ලොට් ''බී" ලොට් ''සී" ලොට් ''ඩී" ලොට් "ඊ" ලොට් ''එෆ්" ලොට් ''ජී" ලොට් ''එච්" යනුවෙන් නිරූපිත දකුණු පළාතේ, ගාල්ල පරිපාලන දිස්ත්‍රික්කයේ,හික්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බූස්ස ග්‍රාමයේ පිහිටි ප්‍රමාණයෙන් හෙක්ටයාර් 2.6920 ක් විශාලත්වයෙන් යුතු පහත දැක්වෙන පරිදි මායිම් වූ මුළු ප්‍රදේශය.

ලොට් ''ඒ"

| | |
|---|---|
| උතුරට | : පාර , ප්‍රාදේශීය සභා පාර, එල්. ගුණරත්න සහ තවත් අය හිමිකම්පාන කොග්ගෙ එරොන් අප්පුගේ මිනක්කුඹුර සහ පී.ඩී. නෙලුම් හිමිකම් කියන ඇඹිලිවල කුඹුර ; |
| නැගෙනහිරට | : ප්‍රාදේශීය සභා පාර, එල්. ගුණරත්න සහ තවත් අය හිමිකම්පාන කොග්ගෙ එරොන් අප්පුගේ මිනක්කුඹුර සහ පී.ඩී. නෙලුම් හිමිකම් කියන ඇඹිලිවල කුඹුර සහ පාර(මා.සං.අ.) ; |
| දකුණට | : හිමිකරු නොදන්නා වෙදගෙයි වත්ත, පාර(මා.සං.අ.) සහ පාර ; |
| බස්නාහිරට | : පාර, කේ.ඩී. දාවිත් සිල්වා සහ තවත් අය හිමිකම්පාන ඇලකඩිත්ත සහ පාර. |


1A - G 20169 — 50 (2014/08)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ලොට් ''බී''

| | |
|---|---|
| උතුරට | : පාර(මා.සං.අ.) ; |
| නැගෙනහිරට | : පොකුණ ඇල ; |
| දකුණට | : වාසලගේ ධනසිරි හිමිකම්පාන ජමෙන්තු හැන්දිගෙවත්ත ; |
| බස්නාහිරට | : පාර(මා.සං.අ.). |

ලොට් ''සී''

| | |
|---|---|
| උතුරට | : පාර(මා.සං.අ.) ; |
| නැගෙනහිරට | : කේ.ඩී.ශාන්ත සහ තවත් අය හිමිකම්පාන පතිනිගේ වත්ත ; |
| දකුණට | : කේ.ඩී.ශාන්ත සහ තවත් අය හිමිකම්පාන පතිනිගේ වත්ත සහ මෙම සැලැස්මේ ලොට් ''ඩී'' දරන කොටස ; |
| බස්නාහිරට | : සැලැස්මේ ලොට් ''ඩී'' සහ පාර(මා.සං.අ.). |

ලොට් ''ඩී''

අංක ජී.ඒ.එච්.කේ.කේ./11/294 දරන මිනින්දෝරු ජනරාල්ගේ ඉහත කී සැලැස්මේ ප්‍රවේශ මාර්ගයක් වශයෙන් විස්තර කර ඇති ඉඩම් කොටස

ලොට් ''ඊ''

| | |
|---|---|
| උතුරට | : පාර(මා.සං.අ.) සහ ලොට් අංක ''ඩී'' ; |
| නැගෙනහිරට | : ලොට් අංක ඩී සහ එෆ් ; |
| දකුණට | : ලොට් අංක එෆ්, ජී සහ එච් ; |
| බස්නාහිරට | : ලොට් අංක එච් සහ පාර(මා.සං.අ.). |

ලොට් ''එෆ්''

| | |
|---|---|
| උතුරට | : ලොට් අංක ඊ සහ ඩී ; |
| නැගෙනහිරට | : ලොට් අංක ඩී සහ ජී ; |
| දකුණට | : ලොට් අංක ජී සහ එච් ; |
| බස්නාහිරට | : ලොට් අංක එච් සහ ඊ. |

ලොට් ''ජී ''

| | |
|---|---|
| උතුරට | : ලොට් අංක ඊ, එෆ් සහ ඩී ; |
| නැගෙනහිරට | : ලොට් අංක ඩී සහ කේ.ඩී.ශාන්ත සහ තවත් අය හිමිකම්පාන පතිනිගෙ වත්ත |
| දකුණට | : කේ.ඩී.ශාන්ත සහ තවත් අය හිමිකම්පාන පතිනිගෙ වත්ත සහ කුමාරව ද නන්දාවතී හිමිකම් කියන කොහොඹ ගහ වත්ත ; |
| බස්නාහිරට | : කුමාරව ද නන්දාවතී හිමිකම් කියන කොහොඹ ගහ වත්ත සහ ලොට් අංක එච්. |

ලොට් ''එච් ''

| | |
|---|---|
| උතුරට | : පාර(මා.සං.අ.) ලොට් අංක ඊ, එෆ් සහ ජී ; |
| නැගෙනහිරට | : ලොට් අංක ඊ, එෆ් සහ ජී ; |
| දකුණට | : කුමාරව ද නන්දාවතී හිමිකම් කියන කොහොඹ ගහ වත්ත ; |
| බස්නාහිරට | : කුමාරව ද නන්දාවතී හිමිකම් කියන කොහොඹ ගහ වත්ත. |

09 - 494

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.